# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2447/27 - 2025 ජූලි මස 30 වැනි බදාදා - 2025.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය* : 856-3/2/3/10/275.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2021/HW/360.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවන් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 328, පත්තලගෙදර ග්‍රාම නිලධාරි වසමේ, පත්තලගෙදර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 510614, කලාප අංකය 02, පත්‍ර අංකය 7හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0445ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (04) :

01. **කැබලි අංක 18**
ඉඩමේ නම: දොඩන්ගහලන්දකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: රාජකරුණා ලියන අතුකෝරලලාගේ කසුන් මධුශංක රාජකරුණා, අංක 79, ධම්මානන්ද මාවත, පත්තලගෙදර, වේයන්ගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0191.

02. **කැබලි අංක 19**
ඉඩමේ නම: -; ඉඩමේ විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: - (මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා අවශ්‍ය වී ඇත); ප්‍රමාණය: හෙක්. 0.0013

03. **කැබලි අංක 22**
ඉඩමේ නම: පන්විලකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: විජලත් පතිරන්නැහැලාගේ චන්ද්‍රලතා, අංක 62, රවුම් පාර, පත්තලගෙදර, වේයන්ගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0163.

04. **කැබලි අංක 23**
ඉඩමේ නම: කිඩකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: රාජකරුණා ලියන

අතුකෝරලලාගේ නිමල් කුමාර, අංක 179, ධම්මානන්ද මාවත, පත්තලගෙදර, වේයන්ගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0078.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 අගෝස්තු මස 15 වැනි දින පෙ.ව. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2025 අගෝස්තු මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
අත්තනගල්ල.

2025 ජූලි මස 28 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0361

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.